නුවනත විද්‍යුත් සිංහල සඟරාව
වෙළුම 01, 2022, 28 - 33

සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

# ආවර්ජනා

"මේ මොන කරුමයක් ද බං මේක, ශිට් මෙන්න මේ වෙලාවට තමයි බං අයියේ වනගත වෙන්න හරි මේ මඟුල් ඔක්කොම දමල ගහලා යන්න හිතෙන්නේ නොදන්න රටකට"

"ඒ බූට් සිරී, කෑ නොගහ ඉඳින් බං. උඹත් පොත අතට ගන්නේ ලයිට් යනවා කියලා තියෙන වෙලාවට නෙ. මේ දැන් ඉතින් බොරුවට කෑ ගහනවා"

"අනේ නිකං ඉඳින් අයියේ. උඹත් ඉතින් මගේ ළඟට වෙලා හිටියට ලයිට් ගිය වෙලාවට වැඩක් කර ගන්න බැනෙ. එහෙම කරගන්න මොකෝ උඹ ආභස්සරයෙන් නෙවෙයි නෙ ආවේ. ඔන්න උඹ මට අරව මේවා කියනවා එහෙම නෙවෙයි. වලපල්ලට ගියා ම. උඹ ඒත් මා ව ජෝගියට ගත්තොත්නෙ බලා ගන්නේ"

"ඉඳපන්කෝ උඹ ඔහොම"

මම, අයියට පුටුවෙ ම සිටීමට පවසා, උකුසු ඇස යි ජන්මේ පුරුද්දට යි බිත්තිය අත ගගා පඩිපෙළ ළඟට පැමිණියෙමි.

‘‘අක්කේ..., සුදු අක්කේ..., මට උගුරට එනවා ඕයි. මේ නසරාණිත් කොහේ ගිහින් ද මන්දා මේ වෙලාවෙ ම?’’

අක්කා පල්ලෙහා තට්ටුවේ කාමරයක කුමක් හෝ කරමින් සිටිනු මම දුටුවෙමි. එහෙත් වෙරි මත නිසා දෝ එය හරි හැටි තේරුම් ගැනීමට නොහැකි ය.

‘‘මොකෝ චූටි මල්ලි? පොඩ්ඩක් ඉවසහං ජෙනිය වැඩ නෑ බන්. ඉඳපන් අරෙහෙ මෙහේ ඇවිදින්නේ නැතුව. වැටුණොත්, ඔය සාක්කුවෙ දාන් ඉන්න බෙල්ල ගේන්න වෙන්නෙ අපිට සාප්පුවෙන්. දැන් උඹ බීලත් වැඩියි නේ. මම ගේන්නම් ලාම්පුව. කුමාරයාට කබරයා දාන්න.’’

ගෙදරට කොල්ලන් දෙන්නෙකු සිටිය ද අක්කා සමග සන්සන්දනය කරන විට මමත් අයියත් පරාද ය. මන් ද අක්කා යකඩ ගැහැනියකි. පිරිමි දහයක ශක්තිය ඇතැයි විටෙක මට සිතෙයි. එක බඩවැල කඩන් ආ දූකට, සැපට හැමදේට ම මට සිටින එක ම අක්කණ්ඩි. කුඩා කල සිට ම අප ඇට ඇමතුවේ නසරාණි යන අන්වර්ථ නාමයෙනි. නුවන්ති සිතුමිණි භාග්‍යා, ඇයගේ නම විය. හයර් ස්ටඩීස්වලට අවුරුදු අටක් ම රට ගිහින් මේ කොරෝනා අල්ලපනල්ලෙ ම ලක්දිවට ගොඩ බැහැපු අවාසනාවන්ත මගේ සොහොයුරිය..

‘‘අයියෝ බලහංකො අයියේ, ජෙනිය වැඩ නැනේ.. දැන් එළියට පලයන්කෝ අර කණාමැදිරි එළියෙන්. මේ වෙලාවට තමයි ජෙනරේටරේ අගේ තේරෙන්නේ. අනේ මට බෑ අයියේ."

මා සෝෆාව ආසන්නයේ තිබුණු ඩස්ට්බින් එකට ඔළුව පාත්කරේ අමාරුවෙනි. කළුවරේ ම ඉවෙන් වගේ හොයාගන්න මට පුළුවන්කම තිබුණත් හරියට ම එල්ලය බලා දැමීමට මා හට පුළුවන්කමක් තිබුණේ නැත. ඒ වෙලේ මා මේ ලෝකයේ සිහියෙන් සිටියේ නැති නිසා ය.

‘‘අනේ අම්මපා හොඳට හිටිය කොල්ලෙක් නේ ද මේ අද පිස්සු කෙළින්නේ බීලා බීලා..’’

"මම ඒකිට ආදරෙයි බං අයියේ.. මට බෑ බං ඒකි නැතුව ඉන්න. මගෙ පණත් හරි එයත් හරි.’’

"අනේ උඹගෙ පණ. මගෙන් මොකුත් අහගන්න එපා."

අයියා එසේ කී විගස, මගේ දකුණු කර්ණිකාවේ සිට වම් කර්ණිකාවටත්, ඒ සිට දකුණු කෝෂිකාව හරහා වම් කෝෂිකාවටත් අකුණු සැරක් වදින්නට විය.

"මූ සුරංගිට පණ වගේ ආදරේ කරා ලොකු මල්ලී. ඒක යි ඔය පිස්සෙක් වගේ දොඩවන්නේ"

අක්කා කී ඒ වචන ටික මාගේ කන් වැකුණේ ඉතාමත් දුර සිට යම් කෙනෙකු කියන ලද්දක් මෙනි.

‘‘මං නොදන්නව යි ලොක්කි ඒක. මූ ඉස්පිරිතාලේ ඉඳන් ආපු දවසේ ඉඳන් ම කියවන්නෙ සුරංගි ගැන. මම කොච්චර කිව්ව ද උඹට ඒ කෙල්ල ගැළපෙන්නෙ නෑ කියලා. අනික ඒ කෙල්ල උඹ ගැන හිතන් හිටියේවත් නෑ. උඹට බෙහෙත් කළ පලියට උඹ මොකට ද ඒ කෙල්ලට ලව් කරන්න ගියේ..?’’

‘‘දැන් ඕව ගැන කතා කරලා වැඩක් නෑ මල්ලී. මූට කොච්චර කිව්වත් ඔච්චර තමයි හරියට බීරි අලින්ට වීණා ගයනවා වගේ.’’

අක්කාගේ සහ අයියාගේ වචන හරඹය මා අසා සිටියේ වෙන කරන්න දෙයක් නැති නිසා ය. ඒ වචනවල යම් කිසි සත්‍යතාවක් නැතුවා ම නොවේ. එහෙත් මගේ හිත නොපිළිගැනීම ප්‍රධාන කාරණය විය. මගේ පපුවේ අකුණු සැර එන්න එන්න ම වැඩි වන බවක් මට හැඟුණි.

‘‘අනේ අක්කේ මගෙ පපුව දනවා බං. මට ග්‍රැමොක්සෝන් ටිකක් ගෙනත් දීපන් බීලා මැරෙන්නවත්. අම්මපා මාව කොරෝනාවත් හැදිලා මැරුණේ නැහැනේ. ඇයි දෙවියනේ මාව බේරා ගත්තේ? මට ඒකෙන්වත් මැරෙන්න තිබුණ නම්. මේ ලෝකෙ මෙච්චර මිනිස්සු මැරෙද්දී, ඇයි මං වගේ කාලකණ්ණි අසරණයෙක් බේරුවේ? මට තව ගෙවන්න පව් වැඩි හින්ද ද?...’’

මම සියල්ලන්ට ම ඇසෙන සේ හඬ නගා ජප කළෙමි.

‘‘කට වහපන් ගොන් වස්සෝ, උඹ උඹගෙ පාඩුවේ ගිහිල්ලා වැඩේ කරගෙන ආව නම් මෙච්චර හදියක් වෙන්නේ නැනේ. උඹ ගියා ඒකිට ලව් කරන්න. ලව් නෙවෙයි මළ ඉලවු’’

‘‘ලොකු මල්ලි අනේ ඔන්න ඕක ව පොඞ්ඩක් අල්ලගෙන එක්කං යන්න එළියට නැත්නම් මේ ගේ සේරම මූ වනසනවා. ගේ නම් වැනසුවත් කමක් නෑ. ඒත් ඩොක්ටර් කිව්වේ මාස හත අටක් යනකන්වත් බොන එක නවත්තන්න ප්‍රතිශක්තීකරණයට හොඳ නෑ කියලා.’’

‘‘මට ඕන ප්‍රතිශක්තිකරණයක් නෑ බං අක්කේ. මට දැන් ඕන මේ තියෙන ප්‍රතිශක්තිකරණෙත් නැති කරගෙන දිවංගත වෙන්න.’’

‘‘අනේ මල්ලී ඔයාගේ ඔය ගොබ්බ තින්කින් ස්ටයිල් එක මේ මං වගේ කෙනෙක් එක්ක ඉඳලාවත් චේන්ජ් කරගන්න බැරි වුණ එක තමයි පුදුමේ.’’

අක්කා, කෙළිලොල් බවක් පාමින් ප්‍රකාශ කළා ය. අක්කාගේ සහ අයියාගේ බැණුම් අස්සෙ මට නං හිතුණේ මගේ ජීවිතය ම නැති වුණා නම් හොඳයි යනුවෙනි.

"මම සුරංගිට කරපු ආදරේ ඒකි දන්නේ නැති වුණාට අනෙක් හැමෝ ම දැනන් හිටියා. අම්මපා මම ඉතාලියේ ඉඳලා මෙහෙ එන්නෙ නැතුව එහෙම මැරිලා ගියා නම් මොන කරුමයක්වත් නැනේ. ඇයි දෙවියනේ වෙන ඉස්පිරිතාලයක් තිබුණෙ ම නැද්ද මාව දාන්න මේකට ම නිරෝධායනය වෙන්න එව්වේ?"

9 772950 655005

මම මට ම කියා ගන්නට වූයෙමි.

මා ලංකාවට ආ දිනයේ ම මා ව පී.සී.ආර්. කිරීමට යොමු කෙරිණි. මට කිසිදු උණක් හෝ හෙම්බිරිස්සාවක් තිබුණේ නැත. එහෙත් පී.සී.ආර්. පරීක්ෂණයේ මට කොරෝනා ආසාදනය වී ඇති බව දක්නට ලැබුණි. එදින ම මා රෝහල් ගත කෙරිණි. දින දෙකක් රෝහල් ගත ව සිටිය ද රෝගයක් ඇති බව නොදැනුණි. එහෙත් ඉන්පසු දින උදෑසන අවදි වන විට මට තද හිස බර ගතියක් සමග හුස්ම ගැනීමේ අපහසුතාවක් දැනෙන්නට විය. නාසයෙන් විශාල හස්ති රාජයෙකු එළියට පැමිණෙන්නා සේ දැනුණි. උගුරේ ඉඳි කටු අනින්නාක් මෙන් වේදනාවක් ඇති බව මට දැනුණි. එම අසීරු වේදනාව, දිගු වෙලාවක් යාමට මත්තෙන් කොරෝනා වැලඳී ඇති බව පසක් කළේ ය.

මගේ දෙමවුපියන් නැති වුණ දින සිට කිසිදු අඩුවක් පාඩුවක් නොකර මවක් මෙන් මා ඇති දැඩි කර බලා ගැනීම සිදු කරනු ලැබුවේ මාගේ දෙවැනි මව් පිය දෙපළ වන අක්කා සහ අයියා විසිනි. මොහොතක් පාසා ඔවුන්ගේ රූපද්වය මගේ සිත ඉදිරියේ ප්‍රතිබිම්බනය වන්නට විය. මා මෙලොවට ඉපදුණේ පියෙකු නොමැති දරුවෙකු ලෙසට ය. මන්ද ඒ වන විටත් මගේ පියා මෙලොව හැර ගොස් ඇති නිසා ය. ඔහු ඉතාමත් දක්ෂ රණකාමී හමුදා සෙබළෙකු වූ බව මගේ අක්කා මට නිතර පවසා ඇත. මගේ කාලකණ්ණිකමට මෙන් මා ඉපදුණු දිනයේ මගේ අම්මා ද මෙලොව හැර ගියා ය. එවිට අක්කාට අවුරුදු දොළහ ලැබුවා පමණකි. අයියාට වයස දහයකි. ලොකු අම්මා ළඟ අප සියලු දෙනා හැදී වැඩුණ ද මවකට සමාන වන්නට ඇයට නොහැකි විය. මා මව් සෙනෙහස විඳ නැති වුව ද මවකගේ සෙනෙහසට සමාන සෙනෙහසක් ලැබූයේ ඒ මගේ අක්කාගෙනි. වයස අවුරුදු දොළහේ සිට අක්කා ඉගෙන ගැනීම සිදු කළේ කෙසේ ද යන වගක් මට මතක නැත. එහෙත් මා බලා ගන්නා අතරතුර ඈ ඇයගේ අධ්‍යාපන කටයුතු ද නිසියාකාරයෙන් සිදු කර ගෙන ඇති බව මට තේරුම් යන විට මගේ වයස අවුරුදු දහයකි. අක්කා උසස් පෙළ කලා අංශයෙන් විශිෂ්ට සාමර්ථ්‍ය තුනක් සහිත ව විශ්වවිද්‍යාලය වරම් ලබා ඇති බව ලොකු අම්මා කතා වෙනු මට ඇසී තිබුණි. විශ්වවිද්‍යාලයට තේරීමේ දී අක්කාට ඉහළින් ම කොළඹ යන්නට හැකි වූ ව ද නිවසේ සිට යාම සඳහා රුහුණට මනාප තුන ම ලබා දී ඇත්තේ මාව බලා ගනිමින් ම අධ්‍යාපන කටයුතු හැදෑරීමට එය මනා රුකුලක් වන නිසා ය. අක්කා මෙන් ම අයියා ද විඳපු දුක සුළු පටු නොවේ. අක්කා මෙන් අයියා එස්.එස්.සී පාස් නොවුණට අවුරුදු දහසයෙන් ම රස්සාවකට ගියේ අපේ පවුලේ බර ඔහු කර මත තබා ගනිමිනි. අක්කා, අම්මා කෙනෙකුගේ වගකීම ඉටු කරන අතරතුරේ අයියා තාත්තා කෙනෙකුගේ වගකීම ඉෂ්ට කරන්නට විය. මම උසස් පෙළ කලා විෂය ධාරාවෙන් හදාරන්නට වූයෙමි. මා වැඩිපුර ආශා කරනු ලැබූයේ භාෂා පැත්තෙන් ඉගෙන ගැනීමට යි. විශිෂ්ට සාමර්ථ්‍ය දෙකක් සහිත ව මම විභාගය සමත් වුණෙමි. මට ඉතාලියේ අධ්‍යාපන වරම් ලබා දීම සඳහා අපේ විදුහල්පතිතුමා පාසලට හිමි වූ ශිෂ්‍යත්වයක් මට සකස් කර දුන්නේ ය. ඉතාලි ගිය ද මා අධ්‍යාපනයට වඩා සිදු කරනු ලැබූයේ රැකියා කර මුදල් ඉපැයීම ය. මගේ වියදම හැරුණු විට මම ඉපැයූ සියලු මුදල් ලංකාවට එවුවෙමි. ඒ මුදල් වියදම් නොකර පරෙස්සමට ගිණුමක තැන්පත් කිරීමට අයියා කටයුතු කළේ ය.

''මල්ලී උඹගෙ සල්ලි බැංකු පොතක් ඕපන් කරලා ඒකට දාලා තියනවා. උඹ ආපු කාලෙක ඒක අරගෙන බිස්නස් එකක් පටන් ගනින්''යනුවෙන් අයියා දවසක් මට කියලා තිබුණා.

9 772950 655005

''මල්ලි උඹ මොනවද කල්පනා කරන්නේ මෙන්න මේ දෙහි ටික බීල ඉඳපන්..''

ඒ කටහඬින් මා ගැස්සී නැවතත් පියවි ලෝකෙට පැමිණියේ, මා සිටි ස්ථානය මට පසක් කරවමිනි.

''හා බන් මම බොන්නම්. පොඩ්ඩක් ඉඳින්කෝ කල්පනා කරන්න මට මේ මොක ද වුණේ කියලා..''

''උඹ මොකද බං අක්කට ඔය කතා කරන විදිය. උඹ කරන කරන හැම රෙද්ද ම ඉවසගෙන ඉන්න නිසා ද ඒ කෙල්ල.''

අයියා මට බැණ වදින්නට විය. මට මා ගැන ම කලකිරුණි. ඇය මාගේ දෙවැනි අම්මා වන බැව් අමතක වීම දුකට කරුණක් විය.

''අනේ මට සමාවෙයන් අක්කේ, මට මේ හැමදේ ම එපා වෙලා තියෙන්නේ. මට දෙහි නෙවෙයි වස ටිකක් ගෙනත් දීපන්..''

''උඹට මොනවත් වෙලා නැනේ. නිරෝධායනය වෙන්න කියලා ඉස්පිරිතාලෙන් අර කඳවුරට දැම්මට පස්සේ ඒකෙ ඇතුළෙ හිටපු ආමි කෙල්ලත් එක්ක උඹ මොකට ද බං පළහිලව්වක් ඇති කරගත්තේ? යකෝ වෙන එවුන් නම් මෙච්චර මේ මාරාන්තික ලෙඩක් හොඳ කර ගත්තට පස්සේ කොච්චර සතුටින් ඉන්නව ද? මූ ඒකට බලාපන්කෝ කොහෙවත් නැති කෙල්ලෙක් අල්ලගෙන මැරෙන්න හදනවානේ''

අයියාගේ සැර පරුෂ හඬ නැවතත් රැව් පිළිරැව් දුණි.

''වැඩක් නෑ ලොකු මල්ලි, ඕව කතා කරලා. වෙන එවුන්ට ජීවත් වෙන්න වාසනාව නෑ. මූට මේ ජීවත් වෙන්න වාසනාව දෙවියන් දීලත් මූ මැරෙන්න හදනවා.''

නැවතත් මගේ වෙරි ගතිය මතින් අතීතය නමැති අඳුරු තිමිර පටල මගේ හදවත පසාරු කරගෙන යන්නට විය. එදා නිරෝධායනය වීම සඳහා හමුදා කඳවුරේ සිටින විට අතපය සෙලවීමට පවා නොදුන්නේ ප්‍රතිශක්තිකරණය අඩාල වීම කොරෝනා රෝගය මාරාන්තික විය හැකි බැවිනි. සුරංගිගේ දීප්තිමත් දෙනයන, නැති ව තිබූ මගේ ප්‍රතිශක්තිකරණය නැවත වර්ධනය කිරීමට සමත් වුණා යැයි පැවසුවහොත් නිවැරදි ය. මාගේ අකමැති ම පලතුර වූයේ දූරියන් ය. එහෙත් ඒ දින කිහිපයේ මා දූරියන් ආහාරයට ගනු ලැබූයේ අන්නාසි කන්නා සේ ය.

''ඔයාගේ නම මොකක් ද? කොහෙ ද ගම?''

එම වචන තවමත් මාගේ දෙකනේ දෝංකාර දෙන්නාක් මෙනි. මම ඇයගේ දෙනයනට මෙන් ම හිනාවට බොහෝ ආදරය කළෙමි. ඉතාලියේ සිටි කාලයේ බොහෝ සුරූපිනියන් මා හට මුණ ගැසුණ ද සුරංගි වැනි කෙල්ලෙක් මා කිසි දින දැක නැත. කාන්තිමත් බවින් යුක්ත ඇයගේ බාහිර ස්වරූපය ඇයගේ සිතට උපමාවක් මෙනි. උදෑසන පහට අවදි වූ පසු, දත් මැද මුහුණ සෝදා නැවතත් ඇඳට යාම අපගේ අනිවාර්ය දින චර්යාව විය. වැසිකිළියට යාමට ඇර වෙන කිසිදු කටයුත්තකට ඇඳෙන් බැසීමට අවස්ථාවක් නොලැබුණි. කෙසේ නමුත් මා හට නැගිට යාමට අවශ්‍යතාවක් තිබුණේ නැත. මොකද මා සිටින ඇඳට වම් පැත්තට වෙන්න මඳක් දුරින් ඇය සිටි කාමරය තිබීම එයට හේතු විය. ඇ එම කාමරයේ සිට වාට්ටුවේ සිටින සෑම ලෙඩෙක් ම නිරීක්ෂණය කරනු ලැබුවා ය. විටින් විට ඇගේ තියුණු දෙනෙත මා වෙත යොමු වූයේ, නිසැක ව ම ඇය මා වෙත විශේෂයක් දක්වනවා යැයි ඒත්තු ගන්වමින් ය. ඇ සෑම මොහොතක ම මාගේ ඇඳ වෙත පැමිණ මාගේ සුව දුක් සොයා බැලීම සහ

මට අවශ්‍ය සියලු ම දෑ මා අසලින් ගෙනවිත් තැබුවා ය. මා තනි ව ම ආහාර ගැනීමට සූදානම් වූවත් ඈ කිසි ම මොහොතක මට එය සිදු කිරීමට අවස්ථාවක් නොදුන්නා ය. මා මට ලැබෙන සෑම මොහොතක ම උත්සාහ කළේ, ඇය සමග කතා කිරීමට ය. ඇය සමග අදහස් හුවමාරු කර ගැනීමට ය. එහෙත් එසේ කිරීමට සිත අදිමදි කරනු ලැබුයේ, ඇයගේ රාජකාරිය අපට සාත්තු සප්පායම් කිරීම මිස වෙනයම් කටයුත්තක් නොවන නිසා ය.

.................................

"දූලගේ තාත්තා, නැගිටින්න දැන් දවල් වෙලා. මේ තේ එක බොන්න. මූණ සෝදන්නෙ නැද්ද?"

ඒ හඬ ස්වරය යාන්තමට මෙන් මට ඇසුණි. මම තිගැස්සී අවදි වුණෙමි. අපේක්ෂා, මගේ ආදරණීය බිරිඳ මා ඉදිරිපිට සිටියි. එවිට මා සිටි ලොව පසක් විය. පැරණි ලොවේ අතරමං වී සිටි මා පියවි ලෝකෙට පැමිණියේ මගේ ආදරණීය බිරිඳගේ හඬෙනි. ඈ දැන් මගේ දූවගේ මව යි. මම නැඟිට යුහුසුළු ව ඇඳෙන් බැසීමට තැත් කළ ද ඊයේ දිනයේ දැනුණු කොන්දේ වේදනාව තවමත් සුව නැති බව මට වැටහුණි. මා හැඳ සිටි සරමේ වාටිය මඳක් ඉරී ඇත. සරම හරි බරි ගස්සා ඇඳීමට තැත් කරමින් ඇඳෙන් බහින විට වාටිය පයට පැගී තවත් කොටසක් ඉරුණි.

"මහත්තයාට නම් සරම් පාවිච්චි කරන්න බෑ. එදා ඉඳන් ඔහොම යි. කෝ දෙන්න ඕක මම මහලා දෙන්න"

දූලගේ අම්මාගේ ඉල්ලීම හමුවේ එය ඉෂ්ට නොකර සිටීමට මට නොහැකි විය. මා මඳ සිනාවක් පා වෙන සරමකට මාරු වී හැඳ සිටි සරම දුණි. දූවගේ මධුර මන මෝහනීය ගීතවත් හඬ නිවෙස පුරා පැතිර යයි. ඇය සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ තෙවෙනි වසර ශිෂ්‍යාවකි. සුරංගී මෙන් හරි අපූරු සුන්දරත්වයක් ඇයගේ මුහුණින් මට ඇය දකින වාරයක් පාසා මැවී පෙනෙයි. එහෙත් එසේ සිතෙන්නේ මන්ද යැයි මම නොදන්නෙමි. සමහර විටෙක මා නින්දේ දී සිදු වූ මතකාවර්ජනය නිසා විය හැකි ය. සුරංගීට මා ආදරය කළ නමුදු ඇය මට ආදරේ කළේ නැත. මුහුණේ සුන්දරත්වය ඇගේ හදවතේ පැවතුණි නම් අද ඇය මගේ බිරිඳ වීමට ඉඩ තිබුණි. එසේ නොවීම පිළිබඳ මා අද කම්පා වන්නේ නැත. සුරංගීට වඩා සිය දහස් ගුණයක් යහපත් බවක් අපේක්ෂා සතු විය. එහෙත් ඒ සතුට සමග ම දුකක් හද පසාරු කරගෙන යන්නට විය. ඒ මගේ අක්කා සහ අයියා සිහි වීමෙනි. මට මවක හා පියෙකු මෙන් සිටි ඒ දෙපළ දැන් ජීවතුන් අතර නැති බව මට පසක් විය. ඔවුන් දෙදෙන මා හැර ගොස් දැන් අවුරුද්දක් පමණ ගත වන බව මට පසක් විය. අයියා සහ අක්කා අනුරාධපුර පිච්ච මල් පූජාවට ගොසින් එන අතරතුර සිදු වූ රිය අනතුරින් මෙලොවින් සඳහට ම සමුගත්තෝ ය. ඒ ඔවුහු පව්කාර නිසා නම් නො ව, ඔවුන් කළ පින් මෙලොව සිටීමට වඩා දෙව්ලොව උපත ලැබීමට අවැසි නිසා බව මම දනිමි. මා හට ඔවුන් ව සිහිනෙන් පෙනුණේ, දෙව්ලොව තවදුරටත් සිටීමට පින් අවැසි බව සිහි ගැන්වීමට මෙනි. හාමුදුරු නමක් ලවා බණ දේශනාවක් පවත්වා දානයක් දීම සිදු කිරීම මීළඟට මගේ සිතේ ඇඳුණු ආශාව විය.

සමාප්ත යි.

9 772950 655005

එච්.ඩබ්. නිපුන තත්සර
සිව්වන වසර
සිංහල අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය
nipunwithanage4470@gmail.com

9 772950 655005